# 7 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## ඒකකය 6
## සමර්පණ මෘදුකාංග




# 6.1 සමර්පණයක් හඳුනා ගනිමු.

ඩී.එම්. චන්දන කුමාර මයා
පු/ආණ/ශ්‍රී රතනපාල මහා විද්‍යාලය - මහඋස්වැව

# සමර්පණ හැඳින්වීම

- එදිනෙදා කටයුතු වලදී අප විසින් තොරතුරු, අදහස් මෙන්ම දැනුම ආදිය අන්අය සමඟ හුවමාරු කර ගනියි.
- මෙය සන්නිවේදනය (Communication) ලෙස හැඳින්වේ.
- පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් තම අදහස්, සිතුවිලි, දැක්ම හෝ මතවාදය වෙනත් අයට දැක්වීම සඳහා අනුගමනය කරනු ලබන ඕනෑම ක්‍රමවේදයක් සමර්පණයක් හෙවත් ඉදිරිපත් කිරීමක් (Presentation) ලෙස හැඳින්විය හැකිය.
- අතීතයේ දී මිනිසුන් වචන සහ අංග චලන යොදා ගනිමින් තම අදහස්, සිතුවිලි අන් අයට ඉදිරිපත් කිරීමට යොමු විය.
- නමුත් ක්‍රමයෙන් සිදු වූ තාක්ෂණික දියුණුවත් සමඟ කලින් කළට නිර්මාණය වූ විවිධ තාක්ෂණික මෙවලම් යොදා ගනිමින් වර්තමානය වන විට ආකර්ෂණීය ලෙස තම අදහස්, සිතුවිලි, මතවාදය අන් අයට ඉදිරිපත් කිරීමට යොමු වී ඇත.

# විද්‍යුත් සමර්පණ හැඳින්වීම

- විද්‍යුත් සමර්පණයක් යනු, ඉදිරිපත් කිරීමක් සජීවී බවක් සහිතව ආකර්ෂණීය සහ ඵලදායීව සිදු කිරීම සඳහා භාවිත කරන තාක්ෂණික ක්‍රමවේදයකි.

- විද්‍යුත් සමර්පණයක් පොතකට සමානය. නමුත් සම්පූර්ණයෙන්ම සමානත් නැහැ.

| පොත | විද්‍යුත් සමර්පණ |
|---|---|
| ○ පොතක පිටු පවතී. | ○ සමර්පණයක කදා (Slides) පවතී. |
| ○ පොතක පිටු පෙරලිය හැකිය. | ○ කදාවෙන් කදාවට මාරුවිය හැකිය. |
| ○ පොතක වචන, පින්තූර ඇතළත් වේ. | ○ සමර්පණයක වචන, පින්තූර ඇතළත් වේ. |
| ○ පොතක වීඩියෝ දර්ශන, ගීත ඇතුළත් කළ නොහැක. එමඟින් ලැබෙන සජීවී බව පොතේ නැත. | ○ සමර්පණයක වීඩියෝ දර්ශන, ගීත ඇතුළත් කළ හැකිය. එමඟින් ලැබෙන සජීවී බව සමර්පණයක පවතී. |

# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

- විද්‍යුත් සමර්පණයක් මඟින් ලබා දීමට බලාපොරොත්තුවන පණිවිඩය නිවැරදි අයුරින් නරඹන්නන් හට ලබාදීමට නම් විද්‍යුත් සමර්පණය ගුණාත්මක බවින් යුක්ත විය යුතුය.

- විද්‍යුත් සමර්පණයේ අන්තර්ගත කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම තුළින් සමර්පණයේ ගුණාත්මකබව වර්ධනය කර ගත හැකිය.

- මෙසේ විද්‍යුත් සමර්පණවල ගුණාත්මකභාවය වැඩි කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.

1. අඩංගු වාක්‍ය පේළි ප්‍රමාණය
2. අකුරුවල විශාලත්වය
3. වර්ණ භාවිතය
4. අක්ෂර වින්‍යාසය සහ භාෂා යෙදවුම් නිවැරදිවීම
5. පින්තූර, වගු හෝ ප්‍රස්තාර ඇතුළත් කිරීම
6. චලන චිත්‍ර සහ වීඩියෝ ඇතුළත් කිරීම
7. අරමුණ ඉලක්ක ගත කිරීම

# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 1. අඩංගු වාක්‍ය පේළි ප්‍රමාණය

- අකුරු ප්‍රමාණය මෙන් ම කදාවක අඩංගු විය යුතු වාක්‍ය පේළි ප්‍රමාණය ද වැදගත් ය.
- බොහෝ දුරට එක් කදාවකට උචිත වන්නේ පේළි 6 - 9 අතර ප්‍රමාණයකි.
- ඊට වඩා ඇතුළත් කිරීමෙන් අකුරු කුඩා වීම හා කියවීමට වැඩි කාලයක් ගතවීම වැනි ලක්ෂණ ඇතිවිය හැකිය.

1

- The quick brown fox jumps over the lazy dog. The quick brown fox jumps over the lazy dog. The quick brown fox jumps over the lazy dog. The quick brown fox jumps over the lazy dog.
- The quick brown fox jumps over the lazy dog. The quick brown fox jumps over the lazy dog. The quick brown fox jumps over

2

- The quick brown fox jumps over the lazy dog.
- The quick brown fox jumps over the lazy dog.
- The quick brown fox jumps over the lazy dog.

# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 2. අකුරුවල විශාලත්වය

- **විද්‍යුත් සමර්පණයේ කදාව තුළ අඩංගු වන අකුරුවල විශාලත්වය සහ සමර්පණය සහ ප්‍රේක්ෂකයා අතර දුර ප්‍රමාණය මෙහිදී සලකා බැලිය යුතුය.**

- **සාමාන්‍යයෙන් අකුරු ප්‍රමාණය පොයින්ට්** 32 (32 Points Font-size) **හෝ ඊට වඩා වැඩි විය යුතු ය.**

- **එවිට නරඹන්නාට දෘශ්‍ය රාමුවේ ඇති තොරතුරු පැහැදිලි ව කියවිය හැකි වනු ඇත.**

| 1 | 2 |
|---|---|
| විද්‍යුත් සමර්පණ | **විද්‍යුත් සමර්පණ** |


# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 3. වර්ණ භාවිතය

- විද්‍යුත් සමර්පණ සඳහා යොදා ගනු ලබන වර්ණ ද ඉතා වැදගත් වේ. වඩාත් ඉස්මතු කළ යුතු දේ සඳහා තද වර්ණ, අකුරු බෝල්ඩ් කිරීම හෝ වෙනත් අකුරු යෙදීම සුදුසු ය.

- රතු වර්ණය කඳාව පුරා බහුල ව යෙදීමෙන් නරඹන්නාට අපහසුවක් ගෙන දෙන්නක් විය හැකි නමුත් අවධාරණය කළ යුතු පාඨයක්, අංකයක් හෝ සලකුණක් රතු වර්ණයෙන් යෙදීම සුදුසු ය.

- කෙසේ වෙතත් වර්ණ යෙදීමේ දී අක්ෂරවලට හා පසුබිමට යොදනු ලබන පාට වර්ණ ප්‍රභේදනය (Contrast) පිළිබඳ ව සැලකිලිමත් විය යුතුයි.



# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 4. අක්ෂර වින්‍යාසය සහ භාෂා යෙදවුම් නිවැරදිවීම

- නිර්මාණයකල විද්‍යුත් සමර්පණය කිහිප අවස්ථාවක් ම හොඳින් කියවා බලා අක්ෂර වින්‍යාසය හා භාෂා යෙදුම් නිවැරදි දැයි බැලීම අනිවාර්ය කටයුත්තකි.

- වැරදි අක්ෂර යෙදුම් සහ භාෂා භාවිතය සහිත සමර්පණයක් මඟින් ඉදිරිපත් කරන තොරතුරු හෝ අදහස් පිළිබඳ නිවැරදි අවබෝධයක් නරඹන්නන්හට ලබා ගැනීමට නොහැකිවනු ඇත.

- සමර්පණය භාවිතයෙන් ඉදිරිපත් කිරීම සිදුකරන්නාහට ද නරඹන්නන් ඉදිරියේ අපහසුතාවයට පත්වීමට සිදුවීම නිසා ඉදිරිපත් කිරීම සාර්ථකව සිදුකර ගැනීමට නොහැකිවීම.

- ඉදිරිපත් කිරීම සහ ඇතුළත් තොරතුරු පිළිබඳ ප්‍රේක්ෂකයන්ගේ විශ්වාසය නැතිවී යාම සිදුවිය හැකිය.

# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 5. පින්තූර, වගු හෝ ප්‍රස්තාර ඇතුළත් කිරීම

- විද්‍යුත් සමර්පණයක් භාවිතයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කිරීමේ දී එය නිවැරදිව පහසුවෙන් නරඹන්නන්හට අවබෝධ කරවීම සඳහා පින්තූර, වගු සහ ප්‍රස්තාර භාවිත කළ හැකිය.

- පින්තූර, වගු සහ ප්‍රස්තාර ආදිය අන්තර්ගත කරන්නේ නම් එක් කදාවක (Slide) ඇතුළත් කිරීමට යෝග්‍ය වන්නේ උපරිම ලෙස දෙකක් පමණි.

- එයට හේතුව වන්නේ වැඩි ප්‍රමාණයක් පින්තූර, වගු සහ ප්‍රස්තාර ඇතුළත් කිරීමෙන් අදාල තොරතුරු නිවැරදිව ලබා දීමට නොහැකි වීමයි.







# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 6. චලන චිත්‍ර සහ වීඩියෝ ඇතුළත් කිරීම

- **චලන චිත්‍ර සහ වීඩියෝ** (Animation and Videos) **ඇතුළත් කරන්නේ නම් එක් කදාවක** (Slide) **එකක් පමණක් ඇතුළත් කිරීම වඩාත් සුදුසු ය.**

- **එක් කදාවක වීඩියෝ කිහිපයක් යොදා ඇතිවිට ඒවාට යොදා ඇති ශබ්ද මිශ්‍ර වීම මෙන් ම ප්‍රේක්ෂකයාට නැරඹීමේ බාධා ද ඇති විය හැකි ය.**

1



2



# ගුණාත්මක විද්‍යුත් සමර්පණයක ලක්ෂණ

## 7. අරමුණ ඉලක්ක ගත කිරීම

- සමර්පණ නිර්මාණය කිරීමේ දී ඉදිරිපත් කරන්නාගේ අරමුණට අදාළව නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ.


- විද්‍යුත් සමර්පණයෙන් බලාපොරොත්තු වන අදහස ඉක්මවා ගොස් වෙනතකට ප්‍රේක්ෂකයා යොමු නො වන ආකාරයට බහුමාධ්‍ය අන්තර්ගත කළ යුතු ය.

- එසේ නොවනවිට සිදු වනුයේ සමර්පණය මගින් ප්‍රේක්ෂකයා අතරමං කිරීමකි.

- උදාහරණයක් ලෙස සමර්පණයේ අන්තර්ගත සජීවීකරණ (Animation) අනවශ්‍ය ලෙස යොදා ගැනීම නිසා ප්‍රේක්ෂකයා ඒ පිළිබඳව අවධානය යොමු කළහොත් ඉදිරිපත් කරන්නාගේ අරමුණ වෙත ළඟා වීමට බාධා ඇති වේ.

# විද්‍යුත් සමර්පණ භාවිත කිරීමේ වාසි

- විද්‍යුත් සමර්පණ මඟින් සාමාන්‍ය ඉදිරිපත් කිරීමකට වඩා වාසි රැසක් ලබා ගත හැකිය.




- ➢ වචන විශාල ප්‍රමාණයක් භාවිත කිරීමට සිදුවීම.
- ➢ කරුණු පැහැදිලි කිරීම සඳහා වැඩි ආයාසයක් දැරීමට සිදුවීම.
- ➢ නරඹන්නන්ගේ අවධානය වෙනස්වීමට ඇති හැකියාව වැඩිය.
- ➢ කරුණු අවබෝධකර ගැනීම සඳහා වැඩි වෙහෙසක් දැරීමට සිදුවීම.

# විද්‍යුත් සමර්පණ භාවිත කිරීමේ වාසි




- වචන විශාල ප්‍රමාණයක් භාවිත කිරීමට සිදු නොවීම.
- කරුණු පැහැදිලි කිරීම සඳහා වැඩි ආයාසයක් දැරීමට සිදු නොවීම.
- නරඹන්නන්ගේ අවධානය වෙනස්වීමට ඇති හැකියාව අඩුය.
- කරුණු අවබෝධකර ගැනීම සඳහා වැඩි වෙහෙසක් දැරීමට සිදු නොවීම.

# විද්‍යුත් සමර්පණ මෘදුකාංග (Electronic Presentation Software)

- **විද්‍යුත් සමර්පණ නිර්මාණය කිරීම සඳහා පහසුකම් සලසනු ලබන්නේ විද්‍යුත් සමර්පණ මෘදුකාංග මඟිනි.**
- **කිසියම් තොරතුරක්, අදහසක් නිර්මාණාත්මක ලෙස විධිමත්ව අන් අයට ඉදිරිපත් කිරීම සඳහා බහුමාධ්‍ය** (Multimedia) **පහසුකම් සලසන පරිගණක වැඩසටහන් විද්‍යුත් සමර්පණ මෘදුකාංග ලෙස හඳුන්වයි.**
- **වර්තමානයේ විද්‍යුත් සමර්පණ මෘදුකාංග රැසක් පවතී.**
- **සමහර විද්‍යුත් සමර්පණ මෘදුකාංග නොමිලේ ලබා ගත හැකි අතර සමහර මෘදුකාංග භාවිත කිරීම වෙනුවෙන් යම් මුදලක් ගෙවීමට සිදු වේ.**
- **නොමිලේ ලබා ගත හැකි මෘදුකාංග නිදහස් සහ විවෘත කේත මෘදුකාංග** (Free and Open Source Software) **ලෙස හඳුන්වන අතර මිල දී ලබා ගත යුතු මෘදුකාංග හිමිකම් සහිත මෘදුකාංග** (Proprietary Software) **ලෙස හැඳින්වේ.**
- **විද්‍යුත් සමර්පණ මෘදුකාංගයක් පරිගණකයේ නොමැතිව වුව ද අන්තර්ජාලය භාවිතයෙන් විද්‍යුත් සමර්පණ නිර්මාණය කර ගැනීමට පහසුකම් සලසන මෘදුකාංග ද නිර්මාණය වී ඇත.**

# විද්‍යුත් සමර්පණ මෘදුකාංග (Electronic Presentation Software)

| මෘදුකාංගයේ නම | නිර්මාණයකළ ආයතනය | නිදහස් සහ විවෘත / මුදල් ගෙවිය යුතු |
|---|---|---|
| Apple Keynote | Apple Incorporation | මුදල් ගෙවිය යුතු මෘදුකාංග |
| Corel Presentation | Corel Corporation | මුදල් ගෙවිය යුතු මෘදුකාංග |
| LibreOffice Impress | Document Foundation | නිදහස් සහ විවෘත මෘදුකාංග |
| Microsoft PowerPoint | Microsoft Corporation | මුදල් ගෙවිය යුතු මෘදුකාංග |
| OpenOffice Impress | Apache Corporation | නිදහස් සහ විවෘත මෘදුකාංග |

- **අන්තර්ජාලය භාවිතයෙන් විද්‍යුත් සමර්පණ නිර්මාණය කර ගැනීමට පහසුකම් සලසන මෘදුකාංග ලෙස** MS Office -365 Power point, Google Presentation, Microsoft Sky Drive - Power point **දැක්විය හැකිය.**

# විද්‍යුත් සමර්පණ මෘදුකාංග (Electronic Presentation Software)

Microsoft Powerpoint

Apple Keynote

OpenOffice Impress

Corel Presentations

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## ඒකකය 6




## 6.1 සමර්පණයක් හඳුනා ගනිමු.